# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13
2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි
( නව/පැරණි නිර්දේශ)

මානවශාස්ත්‍ර පීඨය

ව්‍යවහාරික ඡායාරූපකරණය - IMAT - E 1025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. ඡායාරූප ශිල්පය කලා මාධ්‍යයක් වශයෙන් හඳුනාගෙන එහි සමාජ භාවිතය පිළිබඳ විමසීමක් කරන්න.

2. චිත්‍රාගාර ඡායාරූපකරණය (Studio Photography) සහ එළිමහන් ඡායාරූපකරණය (Outdoor Photography) යනු කුමක් දැයි වෙන් වෙන්ව හඳුන්වා එහි සම විසමතා සංසන්දනය කරන්න.

3. වනජීවී ඡායාරූපකරණයේ දී ඡායාරූප ශිල්පියෙකු විසින් භාවිත කරනු ලබන උපකරණ ලැයිස්තුවක් සකස්කර ඒවා පිළිබඳ විස්තරයක් කරන්න.

4. අංකිත (Digital) තාක්ෂණයේ ආගමනය හේතුවෙන් ඡායාරූපකරණ ක්ෂේත්‍රයට සිදුවී ඇති වාසි හා අවාසි මොණවාදැයි විමසීමක් කරන්න.

5. ප්‍රවෘත්ති ඡායාරූපකරණය (Photojournalism) යනු කුමක්දැයි හඳුන්වා ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පියෙකු විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම කවරේදැයි නිදර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

6. පාරිසරික ආලේඛ්‍ය ඡායාරූපකරණයේ විශිෂ්ටයෙකු ලෙස ආනල්ඩ් නියුමන් (Arnold Newman) හැඳින්විය හැකි ය. නිදර්ශන සහිතව විමසන්න.

7. කෙටි සටහන් ලියන්න.
   i. රූපාංශු (Pixel)
   ii. වාර්තා ඡායාරූපකරණය (Documentary Photography)
   iii. ඡායාරූප සංස්කරණය (Photo Editing)
   iv. ගුවන් ඡායාරූපකරණය (Aerial Photography)

8. ඡායාරූප ශිල්පය අධ්‍යාපන, සංස්කෘතික හා ජනමාධ්‍ය ක්ෂේත්‍රයන්හි අභිවෘද්ධිය සඳහා යොදාගත හැක්කේ කෙසේ දැයි සාකච්ඡා කරන්න.

N/P